රහස්‍යයි

**9/GIT/INS/PR/01**

මගේ අංකය : DOE/9/3/5/GIT/2019-2022(2023
පාසල් විභාග (ඇගයීම්) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2023 නොවැම්බර් මස 03 වන දින.

සියළුම විදුහල්පතිවරුන් වෙත,

**<u>සාමාන්‍ය තොරතුරු තාක්ෂණ (GIT) විභාගය - 2019,2020,2021,2022(2023)</u>**
**<u>උත්තරපත්‍ර පරීක්ෂකවරුන් සඳහා අයදුම්පත්‍ර කැඳවීම.</u>**

උක්ත විභාගය 2023.03.18 දින පවත්වන ලද අතර මෙම විභාගයේ උත්තර පත්‍ර කඩිනමින් ඇගයීම් කර ප්‍රතිඵල ලබා දීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව කටයුතු සංවිධානය කර ඇත. මෙම ජාතික කර්තව්‍යය සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ පාසලේ ගුරු මහත්ම මහත්මීන් උත්තර පත්‍ර ඇගයීම් කිරීමේ කාර්යය සඳහා අයදුම් කිරීමට දිරිගැන්වීමත්, උත්තර පත්‍ර ඇගයීමට අපේක්ෂා කරන ගුරු භවතුන්ගේ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර අදාළ කාලසීමාව තුළ විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සළකමි.

මේ සඳහා පහත උපදෙස් කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

01. අයදුම් පත්‍ර කැඳවීම මාර්ගගත ක්‍රමයට පමණක් සිදු කරන බැවින් 2023.11.03 දින සිට 2023.11.10 දින දක්වා www.doenets.lk වෙබ් අඩවිය මගින් හෝ www.onlineexams.gov.lk/eic වෙබ් ලිපිනය මගින් මාර්ගගතව යොමු කළ යුතුය. (නියමිත දිනෙන් පසුව ලැබෙන කිසිදු අයදුම්පත්‍රයක් භාර ගනු නොලැබේ.)

02. අයදුම්පත්‍ර යොමු කිරීමට අපේක්ෂා කරන සියලුම ගුරුභවතුන්ට මාර්ගගත ක්‍රමයට පමණක් අයදුම්පත්‍ර යොමු කිරීමට උපදෙස් ලබා දිය යුතුය.

03. බාගත කරන ලද (Downloaded) අයදුම්පත්‍රයේ 11 (a) වගන්තිය යටතේ කාලසටහන් නිවැරදි බවට ඔබ හෝ නියෝජ්‍ය විදුහල්පතිවරයකු විසින් සහතික කළ යුතු ය.

04. අයදුම්පත්‍රයේ 12, 13 සහ 14 වන වගන්තිවලට අදාළව නිවැරදිව තොරතුරු ලබා දීමට ගුරු භවතුන්ට විශේෂයෙන් උපදෙස් ලබා දිය යුතුය.

05. එසේම 15 වන වගන්තිය යටතේ අයදුම්කරු තම අත්සන යොදා නිවැරදිව සම්පූර්ණ කර ඔබ වෙත ලබා දෙන අයදුම්පත්‍රවලට අදාළ අයදුම්කරුවන් පමණක් ඇගයීම් සඳහා නිර්දේශ කළ යුතුය.

❖ **<u>ඉතා වැදගත් ය.</u>**

06. බාගත කරන ලද (Downloaded) අයදුම්පත්‍රයේ 16 වන වගන්තිය යටතේ විදුහල්පතිවරයා විසින් සහතික කළ යුතු වේ.

07. School Login හරහා Verification of Marking Examiners වෙත ගොස් එම අයදුම්කරුවන් පිළිබඳ ඔබගේ නිර්දේශ සඳහන් කර එවීම (මාර්ගගත ක්‍රමයට - Online) ඔබගේ රාජකාරි වගකීම වේ. මේ සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් ඔබ පාසල වෙත ලබා දී ඇති පරිශීලන නාමය (User Name) හා මුර පදය(Pass Word) යොදා ගත යුතුය.

**08.** **සියළුම අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍රවල මුල් දෘඪ පිටපත (Original Hard Copy) සහ සහතික කරන ලද ඇමුණුම් සියල්ල 2023.11.10 දිනට පෙර පහත ලිපිනයට එවීමට කටයුතු කළ යුතුය.**

09. එසේම එම අයදුම්පත්‍රවල පිටපතක් කාර්යාලයේ උපලේඛන ගතකොට සුරක්ෂිතව තබා ගැනීමට කටයුතු කිරීම වැදගත් වන අතර, මෙම දෙපාර්තමේන්තුව ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක එය ඉදිරිපත් කළයුතු වේ.

**10.** **තම පාසලේ පරීක්ෂකවරුන්ට අදාළව භාගත කර ගැනීමට ඇති (Download) සාරාංශ වාර්තාව විදුහල්පති විසින් පරීක්ෂා කිරීමෙන් පසු සහතික කර එම වාර්තාව 2023.11.10 දිනට පෙර පහත ලිපිනයට එවීමට කටයුතු කළ යුතුය.**

ලිපිනය

**විභාග කොමසාරිස් ජනරාල්,**
**පාසල් විභාග (ඇගයීම්) ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ. 1503,**
**කොළඹ.**

(ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"GIT 2019,2020,2021,2022,(2023) පරීක්ෂක ඉල්ලුම්පත්‍ර"**ලෙස සඳහන් කරන්න.)

වැඩිදුර විමසීම් :

| | | | |
|---|---|---|---|
| 0112784037 | - ඩබ්.පී.ජී.පී.ඒන්. බන්දුවංශ මිය | - විභාග කොමසාරිස් | - පා.වි. (ඇගයීම්) |
| 011 2785633 | - කේ.සී.එස්. ද සිල්වා මයා | - නියෝජ්‍ය විභාග කොමසාරිස් | - පා.වි. (ඇගයීම්) |
| 011 2785663 | - ඒස්. බාමිණී මෙය | - සහකාර විභාග කොමසාරිස් | - පා.වි. (ඇගයීම්) |
| 011 2785662 | - කේ.ජී.සී.ජේ. බණ්ඩාර මයා | - සහකාර විභාග කොමසාරිස් | - පා.වි. (ඇගයීම්) |
| 011 2785216 | - කේ.කේ. විජයරත්න මයා | - සහකාර විභාග කොමසාරිස් | - පා.වි. (ඇගයීම්) |

0112785231 / 0112785681 - පාසල් විභාග (ඇගයීම්) ශාඛාව

ඩබ්.පී.ජී.පී.ඒන්. බන්දුවංශ
විභාග කොමසාරිස්
පාසල් විභාග (ඇගයීම්)

අත්/කළේ : එච්.ජේ.එම්.සී.ඒ. ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

**01.** ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් :

1.1 චක්‍රලේඛ අංක 03 (01)/2009 හා 2011.03.01 දිනැති සංශෝධිත චක්‍රලේඛයෙහි උපදෙස් අනුගමනය කළ යුතු ය.

1.2 පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ දැනට සේවයේ නියුතු ගුරුවරුන්ට සහ නිලධාරීන්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකි ය.

1. තොරතුරු තාක්ෂණ විෂයය සහිතව සාමාන්‍ය පුහුණුව / විශේෂ ගුරු පුහුණුව / විද්‍යාපීඨ පුහුණුව හෝ උපාධි සහතිකය ලබා තිබීම හා විධිමත් හා ස්ථිර පත්වීමක් ලබා තිබීම.

සහ

2. පාසලක සේවය කරන්නේ නම් අ.පො.ස. (උ.පෙළ) ශ්‍රේණිවල දැනට සාමාන්‍ය තොරතුරු තාක්ෂණය (GIT) විෂයය ඉගැන්වීමේ නිරත වීම හෝ අ.පො.ස. (උ.පෙළ) / අ.පො.ස. (සා.පෙළ) ශ්‍රේණිවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) විෂයය ඉගැන්වීමේ නිරත වීම.

හෝ

අ.පො.ස. (උ.පෙළ) / අ.පො.ස. (සා.පෙළ) එම විෂයයන්ට අදාළව ගුරු උපදේශකවරයෙකු (ISA) ලෙස කටයුතු කිරීම.

හෝ

පරිගණක සම්පත් මධ්‍යස්ථානයන් හි අදාළ විෂය ඉගැන්වීමේ නිරතවන උපදේශකවරයෙකු වීම.

**1.3 අංක 10 සුදුසුකම් සම්පූර්ණ කිරීමේ දී ඉල්ලුම්කරුගේ විෂයයට අදාළ සුදුසුකම් සටහන් කිරීම අනිවාර්ය වේ. එසේම පාඨමාලාව / විෂයන් සටහන් නොකළ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

1.4 ඉල්ලුම්පත්‍රයේ අංක 13 සහ 14 ඡේද සම්පූර්ණ කිරීමේ දී "ඔව්" හෝ "නැත" හෝ යන්න පැහැදිලිව "✓" ලකුණකින් සඳහන් කරන්න. එසේ සඳහන් නොකරන ලද ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

* **දැනට ඔබට විරුද්ධව විනයානුකූල පරීක්ෂණයක් පැවැත්වේ නම් හෝ ඔබ විභාග තහනමකට ලක්වූවකු නම් හෝ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ නොහැකිය.**

(පවුලේ සාමාජිකයා යන්නෙන් අදහස් කරන්නේ ඔබගේ දරුවන් හා දරුවන්ගේ දරුවන් ද ඔබගේ හෝ කලත්‍රයාගේ හෝ සොයුරු සොයුරියන් හා ඔවුන්ගේ දරුවන් ද වේ.)

1.5 පූර්වෝක්ත විභාගයේ උත්තරපත්‍ර ඇගයීම් මධ්‍යස්ථාන මෙහි පහත දක්වා ඇති නගරවල පිහිටුවීමට යෝජිත ය.

ඇගයීම් මධ්‍යස්ථාන පිහිටුවීමට යෝජිත නගර අංක හා නගර

| | | | |
|---|---|---|---|
| 01. කොළඹ | 17. ඇඹිලිපිටිය | 32. කුලියාපිටිය | 48. කල්මුණේ |
| 03. හෝමාගම | 19. බණ්ඩාරවෙල | 33. හලාවත | 49. අක්කරෙයිපත්තුව |
| 08. හොරණ | 20. බදුල්ල | 35. අනුරාධපුරය | 50. මඩකලපුව |
| 10. කළුතර | 23. අම්බලන්ගොඩ | 37. ත්‍රිකුණාමලය | 51. වවුනියාව |
| 12. මීගමුව | 25. ගාල්ල | 38. කෑගල්ල | 53. යාපනය |
| 13. ගම්පහ | 27. මාතර | 41. මහනුවර | 57. දඹුල්ල |
| 14. නිට්ටඹුව | 28. තංගල්ල | 45. හැටන් | |
| 15. රත්නපුර | 30. කුරුණෑගල | 46. මොනරාගල | |

සැ.යු. ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාවක් නොලැබෙන නගරවල ඇගයීම් මධ්‍යස්ථාන පිහිටුවනු නොලැබේ. එබැවින් දෙවන කැමැත්ත ද ඉල්ලුම්පත්‍රයේ සඳහන් කළ යුතු ය.

1.6 ඔබ ඉල්ලුම් කළ යුත්තේ රාජකාරි ලිපිනයට ආසන්නව ම ඇති ඇගයීම් මධ්‍යස්ථානයට ය. එම මධ්‍යස්ථානයේ ප්‍රමාණවත් පුරප්පාඩු සංඛ්‍යාවක් නොමැති නම් වෙනත් ආසන්න ඇගයීම් මධ්‍යස්ථානයකට යොමු කෙරේ.

1.7 මෙම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කර (16 ඡේදය හැර) ඔබේ විදුහල්පතිට / ආයතන ප්‍රධානියාට භාර දෙන්න.

**02.** සහතික කරන නිලධාරියා :

ගුරුවරයකු නම් විදුහල්පති විසින් ද, ගුරු උපදේශකවරයකු නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ / කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද වෙනත් ආයතනයක සේවය කරන්නකු නම් එම ආයතන ප්‍රධානියා විසින් ද මෙය සහතික කළ යුතු ය.

**03.** සහතික කරන නිලධාරියාට උපදෙස් :

3.1 ඉල්ලුම්කරු මෙම ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරන ලද තොරතුරු නිවැරදි දැයි පරීක්ෂාකාරීව කියවා බලන්න.

3.2 ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව 3 වන පිටුවේ අදාළ ස්ථානයෙහි අනිවාර්යයෙන් ම සහතික කරන්න.

3.3 16 වන ඡේදයේ ඉල්ලුම්කරු පිළිබඳ නිර්දේශය සඳහන් කර, අත්සන හා නිල මුද්‍රාව තැබීම ඔබගේ වගකීම වේ.

3.4 මෙය රහස්‍ය වාර්තාවකි. ඔබ වෙත ලැබෙන සියලු ම ඉල්ලුම්පත්‍ර සහතික කිරීමෙන් පසු උපලේඛන ගතකර පිටපත් තබාගෙන 2023.11.10 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට යොමු කරන්න. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"GIT - 2019/2020/2021/2022(2023) පරීක්ෂක ඉල්ලුම්පත්‍ර"** ලෙස සඳහන් කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්
පාසල් විභාග (ඇගයීම්) ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
තැ.පෙ. 1503
කොළඹ

ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කර එවීම සඳහා උපදෙස්

ඉල්ලුම්කරුවන් සඳහා උපදෙස්

1. තරු (*) ලකුණින් දක්වා ඇති කොටස් අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතු අතර, අනෙකුත් කොටස් ද තමන්ට අදාළ වන පරිදි සම්පූර්ණ කළ යුතු ය.

2. මෙහිදී, ඔබ විසින් සත්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතු ය. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම දීර්ඝ කාලීනව විභාග රාජකාරී තහනමකට හා විනයානුකූල කටයුතු කිරීමට හේතු වේ.

3. ඉල්ලුම්පත්‍රයේ සියළුම කොටස් සම්පූර්ණ කර Submit button click කිරීමෙන් පසු ඔබගේ ඉල්ලුම්පත්‍රය PDF ආකාරයට බාගත (Download) කරගත හැකි වේ. එම ඉල්ලුම්පත්‍රයෙහි දෘඪ පිටපතක් (Hard Copy) ඔබ විසින් ලබාගත යුතු ය.

4. එම දෘඪ පිටපතේ (Hard Copy) 11 (a) කොටස (කාලසටහන) අත් අකුරින් සම්පූර්ණ කර විදුහල්පති/ නියෝජ්‍ය විදුහල්පති/ සහකාර විදුහල්පති මඟින් සහතික කරවාගත යුතු ය.

5. සියලුම ඉල්ලුම්කරුවන් තමා මේ සඳහා සුදුසුකම් සපුරා ඇති බව සනාථ කිරීමට ඉල්ලුම්පත සමඟ අදාළ අධ්‍යාපන සහතිකවල (විෂයන් සහිතව) සහතික කරන ලද ඡායා පිටපත් එවිය යුතු ය.

**6. නියමිත පරිදි සම්පූර්ණ කර නොමැති ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කෙරේ.**

සහතික කරන නිලධාරියා සඳහා උපදෙස්

**7. බාගත කරන ලද (Downloaded) අයදුම්පත්‍රයේ 16 වන වගන්තිය යටතේ විදුහල්පති/ ආයතන ප්‍රධානියා විසින් සහතික කළ යුතු වේ.**

**8. සියළුම අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍රවල මුල් දෘඪ පිටපත (Original Hard Copy) සහ සහතික කරන ලද ඇමුණුම් සියල්ල 2023.11.10 දිනට පෙර පහත ලිපිනයට එවීමට කටයුතු කළ යුතුය.**

විභාග කොමසාරිස් ජනරාල්
පාසල් විභාග (ඇගයීම්) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
තැ.පෙ. 1503, කොළඹ.

- අදාළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් කාර්යාලයේ උපලේඛන ගතකොට තබා ගැනීමට කටයුතු කිරීම වැදගත් වේ.
- **පාසලේ පරීක්ෂකවරුන්ට අදාළව භාගත (Download) කර ගැනීමට ඇති සාරාංශ වාර්තාව විදුහල්පති විසින් පරීක්ෂා කිරීමෙන් පසු සහතික කර එම වාර්තාව ද 2023.11.10 දිනට පෙර උක්ත ලිපිනයට එවීමට කටයුතු කළ යුතුය.**

9. ලිපිනය ලියූ කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි "GIT 2019, 2020, 2021, 2022(2023) පරීක්ෂක ඉල්ලුම්පත්‍ර" යනුවෙන් සඳහන් කළ යුතු ය.

10. මීට අමතරව ඉල්ලුම්පත්‍රයෙහි 04 වන පිටුවේ සඳහන් උපදෙස් කෙරෙහි ද ඔබගේ අවධානය යොමු කළ යුතු වේ.

පොදු දුරකථන

| | | |
|---|---|---|
| 011-2784201 | 011-2784204 | 011-2784206 |
| 011-2787207 | 011-2785202 | 011-2786200 |

ඩබ්.පී.ජී.පී.එන්. බන්දුවංශ

විභාග කොමසාරිස් - පාසල් විභාග (ඇගයීම්)